# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,906 — 1970 මැයි 15 වැනි සිකුරාද — 1970.5.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 649 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 659 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 663 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 671 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අර මුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන්ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍ය නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය .

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්ව

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 14 වැනි දින.**
**ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.**
**කොළඹ**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

යක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත් වීමට උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්‍ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත් වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්‍ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයන්ගෙන් සමත් වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්‍ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින් ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉනා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ ඇතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේ කුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් යෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒඒ. 105/එක්ස්. 2191/69.

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු තනතුර

ඉහත සඳහන් මැයෙන්, අංක 14,890 සහ 1970. 1. 23 දින දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ 3 වන ඡේදය—වැටුප් හා දීමනා—යනුවෙන් පළවූ කොටස පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතු බව දන්වමි.

**වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය. වර්ෂයකට රුපියල් 7,800—3×360—8,880/9,600—4×360—11×480—16,320 ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් ය. මෙම වැටුප් ක්‍රමයෙහි රුපියල් 9,600 සහ 13,920 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්‍ෂමතා කඩඉම් තිබේ.

සටහන් :

(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රු. 13,440 වාර්ෂික වැටුප් ඉක්මවා වැටුප් ලැබීමට හිමිවන්නේ ලංඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය හෝ ලබාගත් පසුවය.

(ii) ඒ සාමාජිකත්වය ලබාගත් දින සිට එවකට රුපියල් 9,960 ක වැටුප හෝ උසස් වැටුපක් ලබමින් නොසිටියහොත් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 9,960 ක වැටුපක් ලැබීමට අයදුම්කරුවා හිමිවේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 8 වැනිදා,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය,
තැ. පෙ. 500.

5–347/1—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 51/එක්ස්. 2239/70.

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

### මානව වංශ විද්‍යා සහකාර තනතුර

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මානව වංශ විද්‍යා සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත අකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1970 ජූනි මස 5 වැනිදා.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1970 ජූනි මස 5 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයැදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වනු ඇත.

(ඇ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා/අපේක්ෂිකාව දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහුට/ඇයට පත්වීම දෙනු ලබන්නේ නියමිත කාලසීමාවක් තුළ වැඩ බැලීමේ පදනමක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—

රු. 6,720—12 × 360—3 × 480.—12,480. රු. 11,040 වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයැදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් ශාරීරික සනීපයකින් යුක්ත බව,

(ආ) 1970 ජූනි මස 5 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු බව හා අවුරුදු 35 ට නොවැඩි බව. (දැනටමත් රාජ්‍ය සේවාවේ නියුක්ත වූවන් කෙරෙහි මෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ දර්ශන විද්‍යාව හෝ පිළිබඳ පළමුවන හෝ දෙවන පෙළ ගෞරව උපාධියක් හෝ එම විෂයයන් එකක් පිළිබඳ ඊට වඩා උසස් උපාධියක් ලබා ඇති බව, සහ

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ හෝ වෙනත් උසස් විභාගයක සිංහල භාෂාව නැතහොත් සිංහල සාහිත්‍යය විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා සිටීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කඩදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" ලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 8 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. 500.

5–347/2—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/213

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970 ප්‍රංශ රජයේ කාර්මික සහයෝගතා ශිෂ්‍යත්ව

ප්‍රංශ රජය විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පර්යේෂණ හෝ විශේෂ හෝ ක්ෂේත්‍රයක විශේෂ දැනීමක් ඇත්තාවූද, එම ක්ෂේත්‍රයෙහි වැඩිදුර පුහුණුවක් ලබා ගැනීමට කැමැත්තක් ඇත්තාවූද අය සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කැරේ. ශිෂ්‍යත්ව පිරිනැමෙන ක්ෂේත්‍රයන් මෙහි පහතින් දැක්වේ :—

(1) කෘෂිකර්මය සහ ග්‍රාමීය සංවර්ධනය.
(2) මහජන සෞඛ්‍යය.
(3) ප්‍රවෘත්ති (මුද්‍රණ).
(4) මහජන මුදල් (බැංකු අයවැය).

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මිනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 9 ක් වන්නේ ය. (3 මසක් භාෂාව හැදෑරීම හා 6 මසක් විශේෂ පුහුණුව ලැබීම.)

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ප්‍රංශ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු සි.

(ii) 1970. 5. 31 වැනි දිනට, වයස අවුරුදු 25 ත් 40 ත් අතර විය යුතුසි.

(iii) ප්‍රංශ භාෂාව පිළිබඳ දැනීමක් තිබිය යුතුසි. *

(iv) (1) පිළිගත් විශ්ව විද්‍යාලයකින්, උසස් අධ්‍යාපන ආයතනය කින් හෝ වෘත්තිය ආයතනයකින් පිරිනමන ලද උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ උසස් සහතිකයක් හෝ ලබා තිබිය යුතුසි.

(2) පුහුණුව සඳහා තෝරා ගන්නා විෂයයට සම්බන්ධ කාර්යයක කෙළින්ම නියුතුව සිටින්නකු විය යුතුසි.

(3) 1970. 5. 31 වන විට, එකී විෂය පිළිබඳව අවුරුදු 2 කට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය.

* ප්‍රංශ භාෂා දැනීමක් නොමැති අයද සළකා බලනු ලැබේ. එසේ සළකා බලනු ලබන්නේ, ප්‍රදානයක් සඳහා නාම යෝජනා කිරීම පිණිස තෝරාගනු ලබන අවසථාවත්, ප්‍රංශය බලා පිටත්වන අවසථාවත් අතර කාලය තුළදී ප්‍රංශ භාෂාව පිළිබඳ දැනීමක් ලබා ගැනීමට ඔවුන් සූදානම් බවට ලිඛිත පොරොන්දුවක් දෙන්නේ නම් පමණකි. එම ලිඛිත පොරොන්දුව අයදුම් පතේ 25 වැනි කොටුවේ සඳහන් කළ යුතුසි.

**සංලක්ෂය 1.**— රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.5.31 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ සථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ප්‍රංශයට යාම සහ ආපසු ඒම සඳහා ගමන් වියදම්.

(ආ) මසකට ප්‍රෑන්ක් 750 බැගින් දීමනාවක්.

(ඉ) ඉගෙනීම සඳහා අවශ්‍යකරන උපකරණ හා පොත් මිලදී ගැනීමට යන වියදම් දැරීම් වස් දීමනාවක්.

**සංලක්ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් ප්‍රංශය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් ප්‍රංශයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුසි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එසින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාලපරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයටම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970. 5. 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාවය සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1970 මැයි මස 7 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

5–334—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි ශාරීරික අභ්‍යාස උපදේශිකා තනතුරු

රජයේ ගුරු විද්‍යාලයයන්හි ශාරීරික අභ්‍යාස උපදේශිකා තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය) සඳහා 1970.5.29 වැනි දින හෝ එම දිනට පෙර, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) විසින් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

සටහන.—යම්කිසි අයදුම්පතක් තැපැලේ දී නැතිවී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කෙරෙන කිසිම දෝෂාරෝපණයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම්පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් ඔ එසේ පමාවීමෙන් සිදුවන පාඩුව විඳ දරාගත යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුර සඳහා රු. 3,720—16 × 90 (කාර්‍යක්ෂමතා කඩඉම) 5 × 144—රු. 5,880 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

සටහන.—69.10.1 ට පෙර මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 1,560—14 × 72 —රු. 2,568 කා.ක.ඉ. රු. 2,640—5 × 120—රු.3,240)

3. අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—

(අ) අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ලන්ඩන් මැට්රිකියුලේෂන් වැනි ඊට සමාන සහතිකයක් හෝ සමග පිළිගත් ශාරීරික අධ්‍යාපන ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍රයක් ලබා සිටින්නන් විය යුතුය.

නැතහොත්

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථය සමග ශාරීරික අභ්‍යාස පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්දක් හා උපදේශක තනතුරකට සෑහෙන පමණ උසස් තත්ත්වයකැයි ගිණිය හැකි, පිළිගත් ක්‍රීඩා අතුරෙන් එකකින් හෝ ඊට වැඩි ගණනකින් ප්‍රායෝගික පළපුරුද්දක් ලබා සිටිය යුතුය. ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ඉ) අයදුම්කරුවන්ට සිංහල/දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉගැන්වීමට හැකිවිය යුතුයි.

(ඊ) 1970.5.29 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 22 ට අඩු හෝ අවුරුදු 45 ට වැඩි හෝ නොවිය යුතුයි. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නොයෙදේ.

4. විශේෂ කොන්දේසි.—

(අ) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ගුරු විදුහලකට පත් කර යවනු ලැබේ.

(ආ) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ඊට දායක මුදල් ගෙවිය යුතුවේ. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා තෝරා ගනු ලැබුව හොත්, ඔවුන් මෙම තනතුරු දරණ තෙක්, තනතුරු විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) ඉහත 3 (ආ) ඡේදය යටතේ අයදුම්කරුවකු පත්කිරීම සඳහා තෝරා ගතහොත්, තනතුර විශ්‍රාම වැටුප් රහිතය. එසේ පත් කරගනු ලබන අයදුම්කරුවකු විසින්, තම වැටුපෙන් 5%ක් අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුවේ.

5. පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. මෙම කාර්‍යාලය මගින් මුද්‍රිත පෝර්ම සපයනු නොලැබේ. මෙම දැන්වීමෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍ර අනුව, අයදුම් කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කරගත යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.4.29 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### රජයේ ගුරු විද්‍යාලයන්හි ශාරීරික අභ්‍යාස උපදේශිකා තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. (i) සම්පූර්ණ නම :————.

(ii) මුලකුරුත් සමග නම :————.
(මිය., මෙනවිය යන වග සඳහන් කරන්න.)

2. ලිපිනය :

(i) පෞද්ගලික :————.

(ii) රාජකාරී :————.

3. 1970.5.29 වැනි දිනට නිවැරදි වයස :

අවුරුදු—— මාස—— දින——

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

7. වෘත්තීය සුදුසුකම් (ලබා තිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. ඉගෙනගීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත්වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුල් වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුරු | සේවා කාලය | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | අ. මා. දි. | |
| | | | | | |

10. සිංහල/දෙමළ පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත්— මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————.

12. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන්කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණ හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ————.

විදුහල්පතිගේ නිර්දේශය :————.

5–247—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි අභ්‍යාසාචාර්‍ය/ආචාරිණී තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ ගුරු විද්‍යාලයයන්හි අභ්‍යාසාචාර්‍ය/ආචාරිණී තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරගතයුතු වූ අයදුම්පත් 1970.5.29 වැනි දින හෝ ඊට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම සඳහා කරන ලද ඉල්ලීම් භාරගත නොහැකිය. මෙම දැක්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව, අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කරගත යුතුය.

(ii) යම්කිසි අයදුම්පතක් තැපෑලේ දී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපණයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම්පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් එසේ පමාවීමෙන් සිදුවන පාඩුව විඳ දරාගත යුතුය.

2. (i) **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔවුන් දරණ තෙක් මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනෙහි පිහිටි ඕනෑම ගුරු විදුහලකට පත් කර යවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා**—මෙම තනතුරුවලට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයන් මෙසේය :

(i) පුහුණු උපාධිධාරීන් සඳහා:—රු. 6,024—4 × 144, 8 × 180 සහ 2 × 240—8,520.

(සටහන—69.10.1 ට පෙර මීට අනුරූප වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,420—4 × 120—8 × 180—2 × 240—රු. 5,820)

(ii) උපාධිධාරීන් හෝ ද්විතීයික පුහුණු අය සඳහා : රු. 5,592—7 × 144, 8 × 180 සහ 2 × 240—රු. 8,520.

(සටහන—69.10.1ට පෙර මීට අනුරූප වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,060—7 × 120, 8 × 180 සහ 2 × 240—රු. 5,820)

4. **අවශ්‍ය සුදුසුකම්**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.5.29 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 25ට අඩු හෝ අවුරුදු 50 ට වැඩි හෝ නොවිය යුතුය. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)

(සී) (i) අයදුම්කරුවන් පුහුණු උපාධිධාරීන් හෝ උපාධිධාරීන් විය යුතු අතර, උපාධියෙන් පසු අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින්නන් විය යුතුය. නැතහොත් පුහුණුවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලැබ සිටින ද්විතීයික පුහුණු ගුරුවරුන් විය යුතුය. ඔවුන්ට සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පහත සඳහන් විෂයයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඉගැන්වීමට හැකිවිය යුතුය:—

(ඒ) සිංහල භාෂාව හා සාහිත්‍යය
(බී) දෙමළ භාෂාව හා සාහිත්‍යය
(සී) ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය
(ඩී) අධ්‍යාපන විද්‍යාව
(ඊ) මනෝ විද්‍යාව
(එෆ්) ඉතිහාසය
(ජී) භූගෝල විද්‍යාව
(එච්) ප්‍රජාචාරය
(අයි) බුද්ධ ධර්මය
(ජේ) බාලාංශ ක්‍රම
(කේ) සාමාන්‍ය විද්‍යාව
(එල්) ගණිතය

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිවලටද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.4.26 වැනි දින,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### රජයේ ගුරු විද්‍යාලයයන්හි සිංහල/දෙමළ මාධ්‍ය අභ්‍යාසාචාර්‍ය/ආචාරිණී තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි

1. (i) සම්පූර්ණ නම : ————.

(ii) මුලකුරුත් සමඟ නම : ————. (මයා, මිය, මෙනවිය යන වග සඳහන් කරන්න.)

2. ලිපිනය :—

(i) පෞද්ගලික : ————.

(ii) රාජකාරි : ————.

3. (i) උපන් දිනය : ————.

(ii) 1970.5.29 වැනි දිනට නිවැරදි වයස :—
අවුරුදු——, මාස——, දින——.

4. ජාතිය හා එය ලද අන්දම : ————

5. උපන් ස්ථානය : ————.

(අ) ඉල්ලුම්කරු : ————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා : ————.

(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා : ————.

6. (i) ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් :———— (ලබාතිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

(ii) උපාධියට ගත් විෂයයන් : ————.

7. වෘත්තීය සුදුසුකම් (ලබාතිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත්වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) : ————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :————

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුල්වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුරු | සේවාකාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | | | | | |

10. සිංහල/දෙමළ පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් : ————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල :————

(සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ). ඇමිණිය යුතුය) රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.

12. වෙනත් සුදුසුකම් : ————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්ට ලැබුණ හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————
ඉල්ලුම්කරුගේ අත්සන,

දිනය : ————
විදුහල්පතිගේ නිර්දේශය : ————.

5-248—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

1. මෙම සංස්ථාවේ සපුගස්කන්දේ පිහිටි ඛනිජ තෙල් පිරිපහදුවේ මෙහි පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. සුදුසුකම් සහ පළපුරුද්ද යනාදිය පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුලත් අයදුම් පත් 1970 මැයි මස 31 වෙනි දින හෝ ඊට පෙර කොළඹ 3, ගාලු පාරේ, අංක 113, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, සේවක මණ්ඩල කළමනාකාරතැන වෙත ලැබෙන සේ ලියාපදිංචි කල තැපෑලෙන් එවිය යුතුය.

3. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔවුන් අදාල වැටුප් පරිමාණයෙහි සුදුසු වැටුප් ලක්ෂයක් මත තබනු ලැබේ.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණයන්, සියලුම දීමනා ඇතුලත් ඒකාබද්ධ වැටුප් පරිමාණයන් වේ.

5. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි හෝ සේවකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සළකා බලනුයේ ඔවුන් විසින් ඒවා සිය දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් එවනු ලැබුව හොත් පමණි. අංක 666 හා 1965.8.20 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුකූලව, අදල අයදුම්කරු සිය සේවයෙන් මුදවා හැරිය හැකිදැයි යන්න දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

6. අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලබන අතරම, මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සේවා කොන්දේසි**

(1) තෝරාගනු ලැබූ අයදුම්කරු විසින් :

(අ) සිය ශාරීරික යෝග්‍යතාවය දක්වීම සඳහා පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සිය ප්‍රවේසන කාලය තුලදී ලබාගත යුතුය.

(ඉ) සිය වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතුය (ඒ සඳහා සංස්ථාව විසින් 15%ක ප්‍රමාණයක් දායක වනු ඇත.)

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්‍යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම අවශ්‍යය.

(2) තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 3 ක ප්‍රවාසන කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

| තනතුර හා වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු ඒ—2/3 ශ්‍රෙණිය<br>රු. 1,500—2,000<br>10 × 50 | (අ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා (බී. එස්. සී.) උපාධිය.<br>(ආ) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ සහයෝගී සාමාජිකයෙකු වීම.<br>(ඉ) පොම්ප, සම්පීඩක, ටර්බයින් යන්ත්‍ර, බල බොයිලේරු, උඳුන්, ස්ථම්භයන් හා තාප හුවමාරු උපකරණ වැනි තාප විදුලිබල යන්ත්‍රාගාරයන්හි භාවිතා කෙරෙන යාන්ත්‍රික උපකරණ දිනපතා නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම පිළිබඳව හෝ එවැනි අන්දමේ කර්මාන්තයක හෝ අවුරුදු දහය (10) ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය.<br>වයස අවුරුදු 35ට අඩු නොවිය යුතුය. |
| 2. නඩත්තු ක්‍රම සම්පාදක ඉංජිනේරු ඒ—4 ශ්‍රෙණිය<br>රු. 1,250—1,750<br>10 × 50 | (අ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා (බී. එස්. සී) උපාධිය.<br>(ආ) සංකීර්ණ ඒකකයන්හි, යාන්ත්‍රික ස්වභාවයේ නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් කටයුතු පිළිබඳව අවුරුදු 5ක පශ්චාත් උපාධි පළපුරුද්දක් තිබිය යුතුය.<br>(ඉ) සපයා ඇති මිනිස් ශ්‍රමය උපයෝගී කොටගෙන යෝග්‍ය අන්දමින් හා කාර්යක්ෂමව අලුත්වැඩියා කිරීමේ කාර්‍යයක් ඉටුකිරීම සඳහා සැකසුම් කිරීම, ක්‍රම සම්පාදනය හා වියදම් ඇස්තමේන්තු කිරීම පිළිබඳව ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.<br>වයස අවුරුදු 28 හා 35 අතර විය යුතුය. |
| 3. සහකාර යෝජනා ක්‍රම ඉංජිනේරු ඒ—7 ශ්‍රෙණිය<br>රු. 600—1,000<br>10 × 40 | (අ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා (බී. එස්. සී) උපාධිය.<br>(ආ) සංස්ථාවේ අනෙකුත් දෙපාර්තමේන්තු හා සහයෝගිතාවෙන් යුක්තව, කාර්ය සකැස්ම ක්‍රම සම්පාදනය හා වියදම් ඇස්තමේන්තු කිරීම, ඇතුලුව සැලසුම් හා ඉංජිනේරු කටයුතු පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය.<br>වයස අවුරුදු 25 හා 35 අතර විය යුතුය. |
| 4. පිරිපහදු කාර්මික ශිල්පි බී—2 ශ්‍රෙණිය<br>රු. 450—670<br>11 × 20 | (අ) අවශ්‍ය අවම අධ්‍යයන සුදුසුකම්: කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අටවන ප්‍රමාණය.<br>(ආ) නළ හා පොටවල් කැපීම, සොකට් වැල්ඩිං හා බද්ධ වැල්ඩිං පුරුවු පිළියෙල කිරීම, ඔක්සිජන් දැල්ල මගින් නළ නැමීම හා කැපීම, නළවල පුරුවු, නෙරු ගැට් හා අතු ආදිය වැක් වැල්ඩිං කිරීම, නළ අතු සඳහා අච්චු කැපීම හා නළ ප්‍රසාරණය කිරීමේ උපකරණ පිළියෙළ කිරීම, හා නළ පිළිබඳව සටහන් තේරුම් ගැනීමට පිරිපහදු කාර්මික ශිල්පීන් පළපුරුද්දක් ලබා සිටිය යුතුය.<br>(ඉ) අවශ්‍ය අවම මූලික පුහුණුව නම් පිළිගත් ඉංජිනේරු සමාගමක, රජයේ හෝ සංස්ථාවක වැඩ පලක අවුරුදු පහක (5) ආධුනික කාලයක් සම්පූර්ණ කර තිබීමයි.<br>(ඊ) ආධුනික කාලයෙන් පසුව පුහුණු වැඩකරුවෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක කාලයක් සේවය කර තිබීම.<br>(උ) වයස අවුරුදු 25ට වැඩිවිය යුතුය.<br>(ඌ) අතිකාල සේවාවන්හි යෙදීමට සූදනම් විය යුතුය. |
| 5. පිරිවැය ලිපිකරු බී—1 ශ්‍රෙණිය<br>රු. 560—775<br>7 × 20 : 3 × 25 | (අ) යටත් පිරිසෙයින් පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි I හා II යන කොටස් වලින් හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතික පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණයෙන් හෝ සමත් වී සිටිය යුතුය. පිරිවැය ගණකාධිකරණයෙහි පළපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |

113 ගාලුපාර,
කොළඹ 3

සේවක මණ්ඩල කළමනාකාරතැන
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

5-313—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු උතුර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු උතුර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ සඳහන් අයුරු සකස් කරන ලද අයදුම් පත් 1970 මැයි මස 19 වෙනි දිනට පෙර අම්පාර දිසාපති කාර්යාලය, දිසාපති තැන යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

1. **සුදුසුකම්.—**

(අ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 60ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු අක්කරපත්තුව උතුරු කොට්ඨාශයේ පදිංචිකරුවකු වීම.

(ඈ) දෙමළ සත්වෙනි ප්‍රමාණයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වීම.

සිංහල දැනීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

2. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඉ) මෑතදී ලබාගත් චරිතය පිළිබඳ සහතික දෙකක්.

3. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම් පත සම්පූර්ණ කළ යුතුයි.

4. මේ තනතුර සඳහා කෙළින්ම හෝ අන් මගකින් හෝ ආධාර ලබා ගැනීමට ප්‍රයත්න දැරීම නුසුදුසු කමක් ලෙස සලකනු ලැබේ.

5. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සිදුවිය හැකිය. ඒ පිළිබඳ ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

6. මේ ධුරය සඳහා රජයේ, සංස්ථාවල සේවකයින්ගේ ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගේ ද, අයදුම් පත් භාරගනු නො ලැබේ.

7. අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

එම්. බී. සී. කරුණාසේකර,
අතිරේක දිසාපති,
අම්පාර දිසාපති වෙනුවට.

1970.4.29,
අම්පාර දිසාපති කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම් පත

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කරන ලද්දේද ? (එසේ නම් ඒ පිළිබඳ විස්තර) :————.

9. තමන් සතු දේපලවල ප්‍රමාණයන් විස්තර සහිතව එහි වටිනාකම :————.

10. අයදුම්කරු ණය ගැතිව සිටී ද :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ?

12. මෙම තනතුර සඳහා ඇති වෙනත් සුදුසුකම් ඇතොත්, ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

5–164—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සහන නිවේදක තනතුර—වෙළඳ සේවය

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අර්ධකාලීන සහන නිවේදන **(තෙළුගු/මලයාලම්)** තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවයට බඳවා ගනු ලබන අතර, දිනකට රු. 20 ක උපරිම සීමාවට යටත්ව පැයකට රු. 2.50 බැගින් ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

අයදුම්කරුවන් කෙටිකාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණුවීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

අර්ධකාලීන සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ සථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විටදී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ලැබේ.

2. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත්වූ අය විය යුතුයි. සිංහල පිළිබඳ සාමාන්‍ය දැනුම අමතර සුදුසුකමක් වේ. ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය කරන යථෝක්ත සුදුසුකම් ඇති නිලධාරීනටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

3. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 මැයි 31 දිනට පෙර ලැබෙන සේ කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර " සහන නිවේදක (තෙළුගු/මලයාලම්) " යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

4. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

එන්. බී. ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 මැයි මස 2 දින,
ලංකා ගුවන් විදුලි සංස්ථාව,
කොළඹ 7.

### නිදර්ශන ආකෘති පත්‍රය

**සහන නිවේදක තනතුර (තෙළුගු/මලයාලම්)**

1. සම්පූර්ණ නම :————.
2. සථිර ලිපිනය :————.
3. උපන් දිනය සහ සථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. 1970. 5. 31 දිනට වයස :——අවුරුදු :——මාස :—— දින :——.
5. ජාතිය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)
7. භාෂා පිළිබඳ ප්‍රවීණතාව :————.
(අ) තෙළුගු සහ මලයාලම් :————.
(ආ) සිංහල :————.
(ඇ) වෙනත් භාෂා :————.
8. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරද්ද හා වෙනත් විශේෂ හිම්කම් පිළිබඳ විස්තර :————.
9. සහතික පත් ලබාගත් අයගේ නම් හා ලිපින :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය)
10. දැනට යෙදී සිටින හා කලින් යෙදුණ රැකියාවල් පිළිබඳ විස්තර දින සහිතව :————.

————.
දිනය :————. අත්සන.

5–324—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

12. යුද සේවාවට බැඳී සිටියේ නම් සේවා කාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) : ————.

13. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා ලිපිනය සහිත සහතික තුනක පිටපත්, (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————

14. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයෙන් යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සෙකු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————. අංකය :————.

ප්‍රා. අධ්‍යා. අ/ප්‍ර. අධ්‍යා. නි ගේ නිර්දේශය ————.

දිනය :————. ප්‍රා. අධ්‍යා. අ/ප්‍ර. අධ්‍යා. නි. වෙනුවට.

5–196—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

### වෛද්‍ය නිලධාරි තනතුර

1970.3.20 දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රාජකීය ලංකා නාවික හමුදාවේ වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයැදුම්පත් භාර ගැනීමේ දිනය 1970.5.30 වැනි දින තෙක් දීර්ඝ කර ඇත

ඩී. වී. හන්ටර්,
කොමදෝරු,
වැඩ බලන නාවික හමුදාධිපති.

1970 මැයි මස 7 වැනි දින,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ දීය.
තැ. පෙ. 593, කොළඹ.

5–302—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/5/267.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කොළඹ ක්‍රමය යටතේ කාර්මික ඩිප්ලෝමා පාඨමාලා ඕස්ට්‍රේලියාව—1971

ඕස්ට්‍රේලියානු රජය විසින් කොළඹ ක්‍රමය යටතේ පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් පත් භාර ගනු ලබන්නේ පහත සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා පමණය :—

(අ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා :
  (1) ස්වයංක්‍රීය ඉංජිනේරු විද්‍යාව
  (2) ශීතකරණ ඉංජිනේරු විද්‍යාව

(ආ) පූර්ව උපාධි (පස් අවුරුදු) ඩිප්ලෝමා පාඨමාලාව :
  (1) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

දැනටමත් ලංකාවේ හෝ විදේශයක විශ්ව විද්‍යාලයක හෝ කාර්මික විද්‍යායතනයක හෝ පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයෝ මෙම ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ නොවෙති.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය : 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය : 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා එක් අවුරුද්දක් ද, පූර්ව උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා අවුරුදු පහක් ද වේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඕස්ට්‍රේලියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

සුදුසුකම්.—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා 1971.9.1 දිනට වයස අවුරුදු 35 ට අඩුවිය යුතු අතර පූර්ව උපාධි ශිෂ්‍යයන් සඳහා අවුරුදු 22 ට අඩුවිය යුතුය.

(iii) උසස් ඉංග්‍රීසි ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

(iv) (අ) ඉහත (අ) (1) යටතේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන්නේ නම් භෞතික විද්‍යාව, ගණිතය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ආශ්‍රිත ඩිප්ලෝමා සහතිකයක් තිබිය යුතුය.

(ආ) ඉහත (අ) (2) යටතේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන්නේ නම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබිය යුතුය.

(ඉ) ඉහත (ආ) (1) යටතේ පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන්නේ නම් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එකම වතාවකදී සමත් වී සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971.9.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේය.

**සංලක්ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුලත් ය :—

(ඒ) දිවයිනේ සිට ඕස්ට්‍රේලියාවට යාමට සහ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු දිවයිනට ඒමට ගමන් පහසුකම්,

(බී) යැපීම් දීමනාවක්.

(සී) ඇඳුම් දීමනාවක්,

(ඩී) සංස්ථාපනයවීම සඳහා දීමනාවක්.

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය

### රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය

රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් පිරිනැමීම සඳහා පරීක්ෂණයක් පරිපාලන අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ඇත. ලංකා පරිපාලන සේවයේ සියළුම නිලධාරීන්ට හා රාජ්‍ය සේවයේ අනෙකුත් පරිපාලන ශ්‍රේණිවල නිලධාරීන්ටද මෙම පරීක්ෂණයට පෙනී සිටීමට හැකි වනු ඇත.

මෙම පරීක්ෂණය පහත සඳහන් අනිවාර්යය විෂයයන් පහෙන් හා තෝරා ගනු ලබන එක් විකල්ප විෂයයකින් යුක්ත වනු ඇත:—

**අනිවාර්ය විෂයයන්**

1. ප්‍රතිපත්ති සාධනය
2. රාජ්‍ය පරිපාලනයෙහි පරමාර්ථ හා හරය
3. කළමනාකාරිත්වය හා සංවිධානය
4. රාජ්‍ය පරිපාලන නීතිය
5. කළමනාකාර ආර්ථික විද්‍යාව.

**විකල්ප විෂයයන්**

1. නිෂ්පාදන සහ සැපයුම් කළමනාකාරිත්වය
2. මුදල් කළමනාකාරිත්වය හා යෝජනා ක්‍රම අගැයුම
3. සමාජ හා ප්‍රජා සංවර්ධන කළමනාකාරිත්වය.

සෑම වර්ෂයකදීම රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ සංක්ෂිප්ත පාඨමාලා කිහිපයක් පරිපාලක අභ්‍යාස ආයතනය විසින් සංවිධානය කරනු ඇත. ඉහත සඳහන් පරීක්ෂණයට සූදානම් වන රජයේ සේවකයන්ට මෙම පාඨමාලා ප්‍රයෝජනවත් වේයයි අපේක්ෂා කරනු ලැබේ. මෙම පාඨමාලාවල පරමාර්ථය වනුයේ ඊට සහභාගි වන්නන්ට රාජ්‍ය කළමනාකාරිත්වයේ මූල ධර්ම පිළිබඳ මූලික දැනීමක් දීම සමගම කළමනාකාරිත්වය පිළිබඳ විද්‍යාත්මක හා නවීන ක්‍රම සම්බන්ධ මනා වැටහීමක් ඇති කර කළමනාකාරිත්වය පිළිබඳ ඔවුන්ගේ ප්‍රවීණත්වය දියුණු කරලීමයි.

1970 ජූලි මස 1 වෙනි දින පටන් ගනු ලබන පළමුවෙනි පාඨමාලාව ලංකා පරිපාලන සේවයේ 5 වෙනි ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සීමා වනු ඇත. මෙම පාඨමාලාවන්ට සහභාගිවීම සඳහා අයදුම් පත් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂට 1970 මැයි මස 30 වෙනි දිනට හෝ ඊට කලින් ලැබෙන සේ එවිය යුතුයි.

එච්. එස්. වනසිංහ,
පාරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ සහ
පරිපාලන අභ්‍යාස ආයතනයේ
අධ්‍යක්ෂ.

1970 මැයි මස 8 දින,
පරිපාලන අභ්‍යාස ආයතනය,
28/10, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7.

## පරිපාලන අභ්‍යාස ආයතනය

### රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය—1970 ජූලි-අගෝස්තු පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍රය

I කොටස
(අයදුම්කරු විසින් සම්පූර්ණ කළයුතුය)

1. සම්පූර්ණ නම :————.
   (නාමය යටින් ඉරක් අඳින්න) (පැහැදිලි අකුරින්)
2. වයස :————. උපන් දිනය :————.
3. දෙපාර්තමේන්තුව :————.
4. තනතුර :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (ලබා ඇති උපාධි හා ඩිප්ලෝමා සහතික ද හැදෑරූ විෂයයන් පිළිබඳ විස්තරද ඇතුළත් කරන්න.)
6. සහභාගිවී ඇති අභ්‍යාස පාඨමාලා, සම්මන්ත්‍රණ, යනාදිය හා අනෙකුත් වෘත්තීය පුහුණුවීම් හා විභාග පිළිබඳ විස්තර :————.
7. ලිපිනය හා ටෙලිපෝන් අංකය :————.

............................. වන මම, ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනීමේ හැටියට නිවැරදි බව මෙයින් සහතික කරමි. පුහුණුවීමේ පාඨමාලාවලට සහභාගිවීම සඳහා තෝරා ගනු ලැබුවහොත් පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ තැන විසින් නියම කරනු ලබන කොන්දේසි හා උපදෙස්වලට අවනත වීමට පොරොන්දුවෙමි.

————,
අත්සන.

දිනය :————.

II කොටස

තෝරා ගනු ලැබුවහොත් ............................. මහතා වැටුප් සහිත නිවාඩු පිට ඉහත සඳහන් අභ්‍යාස පාඨමාලාවලට සහභාගිවීම පිණිස මුදාහැරිය හැකි බවද මෙම කාලසීමාව තුළදී එම නිලධාරියාට කිසියම් රාජකාරියක් හෝ කටයුත්තක් භාර නොදෙන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

————,
නාම යෝජනාව ඉදිරිපත් කරන නිලධාරියාගේ
අත්සන සහ තනතුර.

5–343—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද, විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයන්හි දී ද 1970/71 වර්ෂයේ පැවැත්වෙන අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමාව සඳහා පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද, විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයන්හි ද පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස දැනට රජයේ පාසැල්වල හෝ ගුරු විද්‍යාලවල සේවය කරන උපාධිධාරී ගුරුවරුන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1970 මැයි මස 29 වැනි දින හෝ ඉන් පෙර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට/ප්‍රධාන අධ්‍යාපන නිලධාරිවරයාට ලැබෙන සේ පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර එවිය යුතුවේ.

**සංලක්ෂ්‍යය**—යම්කිසි ඉල්ලුම් පත්‍රයක් තැපැලේදී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපනයක් ගැන සලකා බැලිය නොහැකිය. ස්වකීය ඉල්ලුම් පත්‍රය එවීමට අවසාන දිනය දක්වා පමාවන ඉල්ලුම්කරුවන් විසින්ම එසේ පමාවීමෙන් වන පාඩුව විඳ දරාගත යුතුය.

2. මෙම ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කාලීනය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු විසින් ම තමා—

(අ) ලංකාවේ පුරවැසියකු බවට,

(ආ) 1970. 1. 1 දිනට වයස අවුරුදු 45 කට නොවැඩි බවට,

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු බවට,

(ඊ) උපාධිධාරී වැටුප් ක්‍රමය, යටතේ උපාධිධාරී ගුරුවරයෙකු වශයෙන් 1970. 1. 1 දිනට අවුරුදු 5 කට නොඅඩු කාලයක් අධ්‍යක්ෂ පාලිත පාසැලක හෝ රජයේ පාසැලක හෝ ගුරු විද්‍යාලයක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබෙන බවට,

(i) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරියා විසින් හෝ පත්වීම අනුමත කරනු ලැබ පිළිගත් පෞද්ගලික පාසැලක යෝග්‍ය ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කර ඇති සේවය ද 5 අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්ද ගණන් ගැනීමේ දී පිළිගනු ලැබේ. මෙම කාර්යය සඳහා, 1951 දී ගාස්තු අය කරන පාඨශාලා බවට පත් වූ උපකෘත පාඨශාලා

සහ

1960. 12. 1 දින ගාස්තු අය නොකරන පෞද්ගලික පාසැල් බවට පත් වූ පාඨශාලාත් පිළිගත් පෞද්ගලික පාඨශාලා වශයෙන් සැලකේ.

(ii) ප්‍රාචීන පණ්ඩිත සහතිකය මත උපාධි වැටුපෙහි පිහිටවනු ලැබූ, ප්‍රාචීන පණ්ඩිත සහතිකය ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන්ට මෙහි අවශ්‍යව ඇති අවුරුදු 5ක ඉගැන්වීමේ පළපුරුද්ද සඳහා, ඔවුන් උපාධිධාරී වැටුප් ක්‍රමයෙහි පිහිටුවන ලද දිනයේ සිට සේවය ගණන් ගැනීමට ඉඩදෙනු ලැබේ.

(උ) ඉංග්‍රීසි/සිංහල/දෙමළ පිළිබඳ මනා දැනුමක් ඇති අයෙක් බවට ද සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. **පාඨමාලාව.**—

(අ) අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නියමිත කාලය එක් අවුරුද්දකි.

(ආ) මෙම පාඨමාලාව පවත්වනු ලබන කාල සීමාව තුළ කවර අවස්ථාවක හෝ තමාගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක වන ගුරුවරු පාඨමාලාවෙන් නවත්වනු ඇත.

5. **තෝරා ගැනීම.**—ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. විභාගය 1970 ජූලි මස 17 දින විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

විභාගයේ විෂයයන් :—

(1) වත්මන් නතු පිළිබඳ සාමාන්‍ය තොරතුරු හා දැනුම අධ්‍යාපන ප්‍රශ්න පිළිබඳ තොරතුරු හා දැනුම,

(2) සාමාන්‍ය බුද්ධිය,

6. විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවල අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. එබැවින් එම විශ්ව විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීම සඳහා ඉඩකඩ සැලසිය හැක්කේ සිංහල භාෂාව පිළිබඳ මනා ප්‍රවීණතාවයක් ඇති අය සඳහා පමණකි. පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පවත්වනු ලබන පාඨමාලාව ඉංග්‍රීසි පිළිබඳ ප්‍රවීනතාවයක් ඇති අය සඳහා පැවැත්වේ.

7. **ශිෂ්‍යත්ව.**—පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිමවීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක කාල පරිච්ඡේදයක් දෙපාර්තමේන්තුව යටතේ සේවය කිරීමට පොරොන්දු වෙමින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සමග බැඳුම්කරයකට හා ශිෂ්‍යත්ව පත්‍රයකට තෝරාගත් ඉල්ලුම්කරුවන් ඇතුළත් විය යුත්තේ ය. එහෙත්, පුහුණුවීමේ වියදම් රු. 10,000 කට වැඩි කල්හි බැඳුම්කරය යටතේ සේවය කළ යුතු කාල පරිච්ඡේදය අංක 627 හා 63. 11. 25 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තීරණය කරනු ලැබේ.

8. නියමිත කාල සීමාව තුළදී ඩිප්ලෝමා උපාධිය ලබා ගැනීමට අසමත් වන ඕනෑම අපේක්ෂකයෙකු විසින් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු කාලයේ දී වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද සම්පූර්ණ මුදල ආපසු රජයට ගෙවිය යුතුය.

9. **අධ්‍යයන නිවාඩු.**—තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට සම්පූර්ණ කාල වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. එවැනි ඉල්ලුම් කරුවන් විසින් අධ්‍යයන නිවාඩු සඳහා දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති මත එම කාර්යාලය වෙත ඉල්ලුම් කළ යුතුයි.

10. විභාගාපේක්ෂකයා රුපියල් විස්සක් වටිනා මුද්දර අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුය. මුද්දර එක පිට එක ඇලවිය යුතු නැත.

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 මැයි මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ.
ගුරු විද්‍යාල ශාඛාවේදී ය.

**පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ද, විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයන් හි ද 1970-71 වර්ෂයේ පැවැත්වෙන අධ්‍යාපන විද්‍යා ඩිප්ලෝමාව සඳහා වන පශ්චාත් උපාධි පාඨමාලාවට ඇතුළත් වීමේ ඉල්ලුම් පත්‍රයයි**

1. (i) සම්පූර්ණ නම :————.
(මයා/මහත්මිය/මෙනෙවිය/පූජ්‍ය)
(ii) (මුලකුරු සහිතව) නම :————.

2. (අ) උපන් දිනය :————.
1970.1.1 වැනි දිනට වයස අවු :————. මාස :————.
(ආ) ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි අංකය :————.

3. ලිපිනය :————.
(1) රාජකාරි :————.
(2) පුද්ගලික :————.

4. අධ්‍යාපනය ලැබූ විශ්ව විද්‍යාල :————.
(අනු පිළිවෙලින්)

5. උපාධිය :————. විශ්ව විද්‍යාලය :————. වර්ෂය :————.
අංශය ඒ/බී සාමාන්‍ය/විශේෂ සාමාර්ථ/ගෞරව පන්තිය/
කොටස ප්‍රථම/ද්විතීය/තෘතීය/සාමාර්ථය :————.
උපාධිය සඳහා ගත් විෂයයන් :————.
විශ්ව විද්‍යාලයේ දී අධ්‍යාපනය ලැබූ මාධ්‍යය :————.

6. පාසැලේ දී හෝ ඉන් පසුව ලබාගත් ශාස්ත්‍රීය හා වෙනත් විශිෂ්ඨතා :————.

7. දැනට උසුලන තනතුර :————.
තත්ත්වය :—විද්‍යාලයාධිපති, I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය, උප විද්‍යාලයාධිපති විශේෂ තනතුර, I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය/උපගුරු, ගෞරව උපාධිධාරී/උපාධිධාරී :————.
පාඨශාලාව :—රජයේ/අධ්‍යක්ෂපාලිත—

8. (i) ඉගැන්වීමේ පළපුරුද්ද : අවුරුදු :————. මාස :————.
කාලපරිච්ඡේදය :— පාසැලේ නම, ඉගැන්වූ විෂයයන්, මාධ්‍ය, පන්තිය සිට තෙක්
(1)
(2)
(ii) උපාධිය ලැබීමෙන් පසු 1970.1.1 දිනට අධ්‍යක්ෂ පාලිත/රජයේ පාසැලක ඉගැන්වීමේ පළපුරුද්ද :————.

9. ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.
සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම්කරුට ඉගැන්විය හැකි විෂයයන් හා පන්ති :————.
විෂයය :————. උසස්ම ශ්‍රේණිය :————.

10. ඉල්ලුම්කරුගේ වාසියට හේතුවන කවර හෝ විශේෂ අධ්‍යයන හෝ ප්‍රකාශන :————.

11. ඉල්ලුම්කරුගේ පාසැලට සහාය ලැබෙන විෂය මාලාවෙන් බාහිර ක්‍රියා කාරිත්වයන් :————.

12. ඉල්ලුම්කරු විසින් සහභාගි වූ පාසැලෙන් බැහැර සමාජික හා සුභසාධක ක්‍රියා කාරිත්වයන් :————.

13. ස්වකීය ඉල්ලුම් පත්‍රයට වාසිවන පරිදි ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීමට කැමති වෙනත් තොරතුරු :————.

14. මීට ප්‍රථම ලබා ඇති අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර හා බැඳුම්කරයේ කාල පරිච්ඡේදය :————.

15. ඉල්ලුම්කරුට විරුද්ධව විභාග කිරීමට නියමිත කිසියම් විනයානුකූල පරීක්ෂණයක් ඇත්තේ නම් එහි විස්තර :————

16. ඉල්ලුම්කරු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට කැමති මාධ්‍යය සඳහන් කරන්න :————

| |
|---|
| මුද්දර අලවා අවලංගු කරන්න |

ඉහත සඳහන් කළ තොරතුරු නිරවද්‍ය බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(ඉල්ලුම්කරු සේවයෙහි නියුක්ත පාසැලේ ප්‍රධානයා මගින් මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුයි)

5-328—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### වේරහැර ලංකා-ජර්මානු අභ්‍යාස පාඨශාලාවට ආධුනිකයන් ඇතුළත් කර ගැනීම

වේරහැර, ලංකා-ජර්මානු අභ්‍යාස පාඨශාලාවට ආධුනිකයින් ඇතුළත් කර ගැනීම සඳහා පවත්වන තරඟ විභාගයකට පෙනී සිටීමට ඉල්ලුම් පත්‍ර එවන ලෙස ලාංකික පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත පෙනෙන ෆෝර්මය අනුව පිළියෙල කරනලද ඉල්ලුම් පත්‍ර 1970 වේ ජූනි මස 5 වෙනිදාට හෝ ඊට කලින් මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. ඉල්ලුම්කරුවන්ට අඩු වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) අධ්‍යයනය—8 වෙනි පන්තියෙන් සමත්ව සිටීම.

සැළකිය යුතුයි.—8 වෙනි ප්‍රමාණයේ විභාගයේදී සාමාන්‍ය විද්‍යා වෙනි සමත්ව සිටීම අතිරේක සුදුසුකමක් වන්නේ ය.

(ආ) වයස—1970.11.1 වෙනි දිනට අවුරුදු 16 වත් 18 වත් අතර විය යුතුයි

(ඇ) උස—අඩි 4 අඟල් 10යි.

(ඈ) පපුවේ මහත—හුස්ම හළ විට අඟල් 28ක් විය යුතුයි.

3. ඉල්ලුම්කරුවන් විසින් තමන් විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය සඳහන් කර, ඉල්ලුම් පත්‍රවලට පහත පෙනෙන ලිය කියවිලි වල (මුල් පිටපත් නොව) අනුපිටපත් අමුණා එවිය යුතුයි.

(අ) තම අධ්‍යයන සුදුසුකම් ඔප්පු කිරීමට පාඨශාලා සහතික පත්‍ර යක් හෝ ඉල්ලුම්කරු දැන් ඉගෙනීම ලබන හෝ අවසාන වරට ඉගෙනීම ලැබූ පාඨශාලාවේ අධිපති මහතාගෙන් හෝ ප්‍රධානාචාර්ය මහතාගෙන් හෝ ලබාගත් සහතිකයක්. ඉල්ලුම් කරුගේ චරිතය ගැනද ඒ සහතිකයේ සඳහන් විය යුතුයි.

(ආ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍ය තාවයන් සඳහා නිකුත් කරන සහතික පත්‍ර භාරගනු නො ලැබේ.)

4. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවෝ ලිඛිත විභාගයකට කැඳ වනු ලැබෙත්. ලිඛිත විභාගයකට පහත පෙනෙන විෂයයන් අඩංගු වනු ඇත :—

i අංක ගණිතය.

ii. පළමුවෙනි භාෂාව.

iii. දෙවෙනි භාෂාව.

iv. කාර්මික බුද්ධි පරීක්ෂණය හා

v. ඇඳීම පිළිබඳ දක්ෂතා පරීක්ෂණය.

5. මෙම විභාගය කොළඹ, ගාල්ල, මහනුවර, අනුරාධපුරය, බදුල්ල, යාපනය යන මේ ස්ථානවල පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට අදහස් කරන අපේක්ෂකයින් විභාග ගාස්තු වශයෙන් රු. 10 ක මුදල් ඇණවුමක් (මණිඕඩරයක්) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. මුදල් ඇණවුම එවිය යුත්තේ **ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරී මහතාගේ** නමටය. එසේ එවන මුදල් ඇණවුම් පත් කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මාරු කළ හැකි විය යුතුයි. **මැකී ගිය හෝ වෙනස් කරනලද හෝ මුදල් ඇණවුම් පත් භාරගනු නොලැබේ.**

6. ඉල්ලුම්කරුවන් කැමතී විභාග මධ්‍යස්ථානය තම ඉල්ලුම්පත්‍ර යේ සඳහන් කළ යුතුයි.

7. වෛද්‍ය හේතූන් නිසා විභාගයට පෙනී සිටීමට නොහැකිවූ බවට රජයේ හෝ ලියා පදිංචි කරනලද හෝ වෛද්‍යවරයෙකු විසින් නිකුත් කළ සහතිකයක් ඉදිරිපත් කළවිට මිස විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. එවැනි සහතිකයක් ඉදිරිපත් කළ විටද ආපසු ගෙවනු ලබන්නේ ගාස්තුවෙන් හතරෙන් තුනක් (3/4) පමණය. එසේ විභාග ගාස්තු ආපසු ලබා ගැනීමට නම් විභාගය අවසන්වී මසක් ඉකුත්වීමට පෙර මා වෙත ඉල්ලුම් පත්‍රයක් එවිය යුතුයි.

8. ලිඛිත විභාගයට කැඳවනු ලබන ඉල්ලුම්කරුවන් තැපැල්පති විසින් නිකුත් කරනලද හැඳින්වීමේ පත්‍රයක් හෝ ඉගෙනීම ලබන පාසැලේ ප්‍රධාන තැන විසින් හෝ සමාදාන විනිශ්චය කරුවෙකු විසින් හෝ ඉල්ලුම්කරුගේ බවට සහතික කරනලද ඡායාරූපයක් විභාග ශාලාවේදී ඉදිරිපත් කළ යුතුයි.

9. විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු ආදිය ගෙවනු නොලැබේ.

10. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට පුහුණුවීමේ කාලය සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු පහක් (5) වත් මණ්ඩලය යටතේ සේවය කරන බවට රු. 1,000 ක ඇප ඔප්පුවකට අත්සන් තැබීමට නියම කරනු ලැබේ. රු. 1,000 බැගින් ඇපවන ඇපකරුවන් දෙදෙනෙකුද මේ ඔප්පුවට අත්සන් තැබිය යුතුයි.

14. තෝරාගනු ලබන අයදුම්කරුවන් මෝටර් කර්මාන්තය, කම්මල් වැඩ, වෑල්ඩිං වැඩ, මෝටර් රථ විදුලි කර්මාන්තය හා යන්ත්‍ර ශිල්පය පිළිබඳ වැඩ සම්බන්ධයෙන් අවුරුදු හතරක අභ්‍යාස පාඨමාලාවක් හැදෑරිය යුතුයි. තවද, ලංකා ගමනාගමන මණ්ඩලයේ අවශ්‍යතාවයන් අනුව ඔවුන්ට කිසියම් කර්මාන්තයක් පිළිබඳව විශේෂ පුහුණුවක් ලබා දෙනු ඇත.

12. පුහුණුව ආරම්භ කර මාස හයක් (6) ඉක්මවූ පසු ලිඛිත හා ප්‍රායෝගික විභාගයකට ඉදිරිපත් කිරීමෙන් අභ්‍යාස විද්‍යාලීය ආධුනිකත්වය තව දුරටත් කරගෙන යෑමට සුදුසුදැයි නිගමනය කරනු ලැබේ. අවශ්‍ය ප්‍රමාණයේ දැනීමක් ලබා ගැනීමට අසමත් වන අයගේ ආධුනිකත්වය අවසන් කරන අතර, ඔවුන්ට අභ්‍යාස පුහුණුව ලබා ගැනීමට ඉඩදෙනු නොලැබේ.

13. පුහුණුවන කාලය තුළ ගෙවන දීමනා පහත දැක්වේ :—

1 වෙනි අවුරුද්ද දිනකට රු. 1.50

2. වෙනි අවුරුද්ද දිනකට රු. 1.75

3 වෙනි අවුරුද්ද දිනකට රු. 2.00

4 වෙනි අවුරුද්ද දිනකට රු. 3.00

14. නියමිත සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් විභාගයට පෙනී සිටීමට කැඳවනු ලබන අතර, ප්‍රමාදවී එවන ඉල්ලුම්පත්‍ර බාරගනු නො ලැබේ.

15. සියළුම ඉල්ලුම්පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර බහා එවන ලියුම් කවරයේ 'සී' ශාඛාව යන්න ලකුණු කර එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ,
සේවකමණ්ඩල කළමනාකාරතැන.

1970 වේ මැයි මස 6 වෙනි දින,
කොළඹ 5,
නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේදීය.

## වේරහැර ලංකා-ජර්මානු අභ්‍යාස පාඨශාලාවට ඇතුළත් වීමේ ඉල්ලුම්පත්‍ර පෝර්මය

1. සම්පූර්ණ නම :————.
(අවචු අකුරු වැනි පැහැදිලි අකුරින් ලිවිය යුතුයි).

(අ) වාසගම :————.

(ආ) සෙසු නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුයි.)

(ආ) 1970.11.1 වෙනිදා වන විට නියම වයස :—

අවුරුදු :————.

මාස :————.

දවස් :————.

4. ජාතිය :————.

5. අධ්‍යයනික සුදුසුකම් :—

සමත්වූ උසස්ම පන්තිය :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

((ඇ) ඉංග්‍රීසි :————

6. ඉල්ලුම්කරුවා විභාගයට පෙනී සිටීමට කැමති :—

(i) භාෂා මාධ්‍යය :————.

(ii) විභාග මධ්‍යස්ථානය :————.

7. 8 වෙනි ප්‍රමාණයේදී සාමාන්‍ය විද්‍යාවෙන් සමත්වී ඇත්නම් ඒ බව :————

8. (අ) උස :————.

(ආ) පපුවේ මහත :————.

9. මුදල් ඇණවුම් අංකය හා තැපැල් ස්ථානය :————.
(මුල් ඇණවුම් පත් ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුතු අතර ඒවා ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා නමට එවිය යුතුයි. එසේ එවන මුදල් ඇණවුම් පත් කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මාරු කළ හැකි විය යුතුයි. මැකීගිය හෝ වෙනස් කරන ලද මුදල් ඇණවුම් පත් බාරගනු නො ලැබේ.)

මම ඉහත සඳහන් කොට ඇති විස්තර සත්‍ය බවද නිවැරදි බවද මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට කලින් පෙනී ගියොත් එයින් මා නුසුදුස්සෙකු වීමටත් පත්වීමෙන් පසු, පෙනී ගිය හොත් එයින් මා සේවායෙන් පහකර දමනු ලැබීමටත් හැකි වන බව මම දනිමි.

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5-340—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### වාහන් ගිනුම්පත් කැබිනට්වු සැපයීම

නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කාර්යාලයේ ඇති සටහන් සහ මිමි ප්‍රමාණ අනුව, වාහේ ගිණුම්පත් කැබිනෙට්වූ සැපයීම සඳහා ටෙන්ඩර්පත්, කොළඹ තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 ජූනි මස 1 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් හා සපයන්නන්ගෙන් බාරගනු ලැබේ.

2. 1970, ජූනි මස 1 වැනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කටයුතු පිළිබඳ සහකාර අධිකාරී කායශීලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ද එම කාර්යාලයෙන් දැනගත හැක. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුන්ටරයේ රු. 50 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘතිපත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1970 මැයි මස 15 වැනි දින සිට 1970 මැයි මස 30 දින ප. ව. 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

5–331—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### විශේෂ ලියුම් කවර සැපයීම

විශේෂ ලියුම් කවර සැපයීම සඳහා කොළඹ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 ජූනි මස 2 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1970 ජූනි මස 2 වැනි දින, පෙ. ව. 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කටයුතු පිළිබඳ සහකාර අධිකාරී කායශීලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ද එම කාර්යාලයෙන් දැනගත හැක. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුන්ටරයේ රු. 50 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘතිපත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1970 මැයි මස 15 වැනි දින සිට 1970 මැයි මස 30 දින ප. ව. 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

4. අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ නොකරන බැවින්, ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ අමු ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ආනයන බලපත් මෙම දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට බලාපොරොත්තු නොවන කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණි.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

5–330—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ටෙරසෝ මුදුන් සහිත මේස සැපයීම

නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයේ ඇති සටහන් සහ මිමි ප්‍රමාණ අනුව, ටෙරසෝ මුදුන් සහිත මේස සැපයීම සඳහා ටෙන්ඩර්පත්, කොළඹ තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970, ජූනි මස 1 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් හා සපයන්නන්ගෙන් භාරගනු ලැබේ.

2. 1970, ජූනි මස 1 වැනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කටයුතු පිළිබඳ සහකාර අධිකාරී කායශීලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ද එම කාර්යාලයෙන් ලබාගත හැක. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුන්ටරයේ රු. 50ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘතිපත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1970, මැයි මස 15 වැනි දින සිට 1970, මැයි මස 30 වැනි දින ප. ව. 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

5–332—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### පිත්තල මුද්‍රා සහ දින මුද්‍රා

පහත සඳහන් සේවාවන් සඳහා කොළඹ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ටෙන්ඩර් පත් මණ්ඩලයේ සභාපති තුමා විසින්, 1970 ජූනි මස 1 දින, පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(අ) තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල සංකේත නාමයන් පිත්තල මුද්‍රා කැටයම් කිරීම. එකී පිත්තල මුද්‍රා පාවිච්චි කරනු ලබන කාර්යයන් ද එහි කැටයම් කළ යුතුව ඇත.

(ආ) තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල නම් ලෝහ දින මුද්‍රා එම්බොස් කිරීම හා එකී දින මුද්‍රා පාවිච්චි කරනු ලබන කාර්යයන් ද එම්බොස් කිරීම.

2. 1970, ජූනි මස 1 දින, පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා පිළිබඳ සහකාර අධිකාරී කාර්යලයෙන් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1970, මැයි මස 15 දා සිට 1970, මැයි මස 30 දින ප. ව. 4.30 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි, උපකරණ, සුභසාධක හා ගබඩා පිළිබඳ සහකාර අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

5–335—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

යාපනය තැපැල් කාර්යාලයට තාප්පයක් සෑදීම සඳහා ටෙන්ඩර, 1970.6.1 දින පෙ. ව. 10 දක්වා කොළඹ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර මණ්ඩලයෙහි සභාපති විසින් බාරගනු ලැබේ.

2. රු. 10,000 ට වඩා වැය වෙන වැඩ සඳහා මේ දෙපාර්තමේන්තුවේ සහ වෙනත් ගොඩනැගිලි තැනීම් කටයුතුවල නියුක්ත දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර බාරගන්නවා ඇත.

3. ටෙන්ඩර තැන්පත් මුදල වශයෙන් රු. 25 ක මුදලක් ගෙවා කුමන තැපැල් කාර්යාලයකින් වුව ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 26.5.70 දින, පෙ. ව. 10 දක්වා යාපනය (උතුර) ප්‍රාදේශීය තැපැල් අධිකාරිගෙන් ලබාගත හැකි පෝරමවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය.

4. "යාපනය තැපැල් කාර්යාලයට තාප්පයක් සෑදීම පිණිස ටෙන්ඩරය" යන්න ටෙන්ඩරය බහාලන කවරයේ වම් පස ඉහළ කොනේ සඳහන් කළ යුතුය.

5. සභාපති, අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර මණ්ඩලය, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර එවිය යුතුය.

6. වැඩි විස්තර සහ කොන්දේසි, ප්‍රාදේශීය තැපැල් අධිකාරි (උතුර) යාපනය, වෙතින් ලබාගත හැකිය.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

5–338—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

1970 ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලසීමාව තුළ පහත සඳහන් සැපයීම්/සේවාවන් සඳහා, කොළඹ–2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියේ දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ:—

| | I<br>සැපයීම්/සේවය | II<br>ටෙන්ඩර් විවෘත කරන දිනය | III<br>ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය |
|---|---|---|---|
| (1) | කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට, එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන සැපයීම ... | 70. 6.15 ... | 70. 6.14 |
| (2) | කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට මස් සැපයීම ... ... ... | 70. 6.15 ... | 70. 6.14 |
| (3) | කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 70. 6.15 ... | 70. 6.14 |
| (4) | දියතලාවේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරට පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... ... | 70. 6.16 ... | 70. 6.15 |
| (5) | කොළඹ සහ කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට නිල ඇඳුම් සහ බැරැක්ක රෙදිපිළි ඇපිල්ලීම ... | 70. 6.16 ... | 70. 6.15 |
| (6) | කටුනායක පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා රෝහලට මාතෘ නිවාස රෙදිපිළි ඇපිල්ලීම ... ... | 70. 6.16 ... | 70. 6.15 |
| (7) | කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට මෙට්ට, කොට්ට සහ කුෂන් නැවත සකස් කිරීම | 70. 6.17 ... | 70. 6.16 |
| (8) | කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට නිල ඇඳුම්, ඇතිරිලි සහ කුඩාරම් නැවත පිළියෙළ කිරීම | 70. 6.17 ... | 70. 6.16 |
| (9) | කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට පාවහන් අලුත්වැඩියා කිරීම ... | 70. 6.21 ... | 70. 6.20 |
| (10) | කටුනායක, චීනවරාය සහ දියතලාව පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට ගොඩනැගිලි උපකරණ සැපයීම ... | 70. 6.21 ... | 70. 6.20 |

2. ටෙන්ඩර් ආකෘති ලබා ගැනීම පිණිස, කොළඹ—2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයක් සඳහා නැවත ලබාගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. ඉහත සඳහන් එක් එක් සැපයීම්/සේවාවන් ඉදිරියෙහි III වැනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ—2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

5-301—70.5.15 දින අංක 14, 906දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල් ඩබ්ලිව්/2/26.

## පුත්තලම කච්චේරිය

රුපියල් 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියා පදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි සඳහන් තැනීම්වලින් එකකට හෝ වැඩි ගණනක් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 ජූනි මස 6 වැනි දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ :—

(1) නාත්තන්ඩිය, තබ්බෝව අක්කර 80 ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(2) නාගහකටුව ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(3) පාළුවත්ත ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(4) මට්ටකොටුවැල්ල ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(5) තල්විල ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(6) පහල කටුනේරිය ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(7) තොඩුවාව ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(8) නැබොඩගහයාය ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(9) නිකවැරටිය මැ. කො., පොත්තුකුලම-කළුකැලේ පොදු ළිඳක්.
(10) සේරුකැලේ-මුදලක්කුලියේ පොදු ළිඳක්.
(11) වෙන්දකඩුව-පල්ලම ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(12) ගල්කුලිය ම. ප. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(13) හලාවත මැ. කො., අඹකැලේ ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(14) අන්තන්ගනේ ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(15) පුත්තලම මැ. කො. වෙට්ටාලෙයි ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(16) පුත්තලම කච්චේරි භූමියේ ලොරි ගරාජයක්.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී එක් එක් වැඩය සඳහා වෙන වෙනම පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී එක් එක් වැඩය සඳහා රු. 25 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබා ගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබා ගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1970 ජූනි මස 5 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 මැයි මස 6 දින,
පුත්තලම කච්චේරියේදී ය.

5–300—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## දිසාපති කාර්යාලය—පොළොන්නරුව

පොළොන්නරුවේ දිසාපති විසින් මෙහි පහත සඳහන් කර ඇති උපලේඛනයේ සඳහන් වැඩ සඳහා 1970 මැයි මස 30 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් ඉල්ලීමක්ම පිටපත් දෙකින් යුක්ත විය යුතු අතර එය බහාලන කවරය මුද්‍රා තබා පොළොන්නරුවේ දිසාපති වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය. ටෙන්ඩර් බහා ඇති සෑම කවරයකම පිට පැත්තේ තමා විසින් ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ කුමන වැඩක් සඳහාද යන්න පැහැදිලිවම සඳහන් විය යුතු අතර එක් එක් වැඩය සඳහා වෙන් වෙන්ව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ පොළොන්නරුව දිසාපති කාර්යාලයේ රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ටෙන්ඩර් පෝර්මවල වේ.

4. ටෙන්ඩර් පෝර්ම 1970 මැයි මස 29 දින දක්වා මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් නිකුත් කරනු ලැබේ.

5. පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය විසින් මෙම ටෙන්ඩර් පත් 1970 මැයි මස 30 දින පෙරවරු 10.30 ට පොළොන්නරුව දිසාපති කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් හෝ ලියවිල්ලකින් ඔවුන්ගේ බලය ලබා ගත් නියෝජිතයන් හෝ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුවේ. ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති අයවලුන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් කර ඇති මුදල් ප්‍රමාණයන්ද ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසුව ප්‍රකාශ කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ඉදිරිපත් කොට නැති ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කර ඇති මුදල ටෙන්ඩර් පෝර්මයේ අකුරින් හා ඉලක්කමින් ද සඳහන් කළ යුතු වේ. අකුරින් සඳහන් මුදල ඉලක්කමින් සඳහන් කර ඇති මුදලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. යම් ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙකුගේ ටෙන්ඩරය භාරගත් බැව් දන්වා දින 7 ඇතුලත එම ටෙන්ඩර්කරුට පොළොන්නරුව දිසාපති සමග ගිවිසුමකට අත්සන් කිරීමට නොහැකි වුවහොත් හෝ එසේ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් එබඳු ටෙන්ඩරකරුවන්ගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරනු ලැබ ටෙන්ඩරය මා විසින් භාරගත් බැව් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් ටෙන්ඩර පත්‍රයේ සඳහන් ලිපිනයට දන්වා යැව්වහොත් ඉල්ලුම්කරුට එය ලැබුණ බැව් පිළිගනු ලැබේ.

8. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාර ගැනීමේ බලයත් පොළොන්නරුවේ දිසාපති වෙත පවරාගෙන ඇත.

9. පිළිනොගත් ටෙන්ඩර පත් වෙනුවෙන් තැන්පත් කර ඇති ඇප මුදල් පිළිගත් ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු සමග ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ ඇති සෑම මැකීමක්ම හෝ වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරු විසින්ම කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

11. පොළොන්නරුවේ දිසාපති ගෙන් ලිපියකින් ලබාගත් අවසරයක් නොමැතිව තමා ලබාගත් කිසිම කොන්ත්‍රාත්තුවක් අන් අයෙකුට පැවරිය නොහැක.

12. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර කර ඇති මුදලින් සියයට දහයක මුදලක් ඇප මුදල් වශයෙන් කච්චේරියේ තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කරනු ලබන්නේ එම ඇප මුදල කච්චේරියේ තැන්පත් කර කුවිතාන්සියක් ලබා ගත්තායින් පසුවය.

13. ටෙන්ඩර්කරු විසින්ම ටෙන්ඩර් පෝර්ම සුපරීක්ෂාකාරීව කියවා බැලිය යුතු අතර ඒ පිළිබඳව කිසියම් කරුණක් පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය වුවහොත්, පොළොන්නරුව දිසාපති කාර්යාලයේ ගිණුම් අංශයෙන් විමසා බැලිය යුතුය.

14. කොන්ත්‍රාත්තුව විධිවූ පරිදි ඉටු කිරීම සඳහා ඇප වන්නාවූ වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකු විසින් අත්සන් කරන ලද ලිපියක්ද ඔවුන්ගේ ලිපිනයන්ද එක් එක් ටෙන්ඩරය හා සමග ඉදිරිපත් කළ යුතුය.

15. මෙම කොන්ත්‍රාත්තුවල වැඩ සඳහා ලාංකික කම්කරුවන් පමණක් යොදා ගැනීමට කොන්ත්‍රාත්කරු වග බලාගත යුතුය.

16. (අ) සමූපකාර සමිති මගින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේ දී මෙම කොන්ත්‍රාත් වැඩ භාර ගැනීමට ඒ ඒ සමිතිවලට හැකියාවක් ඇති බවත්, ඒ ඒ සමිතිවල මුදල් තත්වය සම්බන්ධයෙන් ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක හෝ තැන්පත් කර ඇති මුදල් සම්බන්ධයෙන් විස්තර දැක්වෙන සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තුමා විසින් නිකුත් කරන ලද ලිපියක්ද මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

(ආ) අනිකුත් අයවලුන්ගේ ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේ දී මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔවුන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් හා එම අයගේ මුදල් තත්වය සම්බන්ධයෙන් වූ විස්තරත් (ඉතිරි කිරීමේ බැංකුවක හෝ වෙනත් බැංකුවක තැන්පත් මුදල්) අඩංගු ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තුමා විසින් නිකුත් කරන ලද ලිපියක්ද මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

17. මුදල් තත්වය සතුටුදායක නොවන සමිතිවලින් හා පුද්ගලයින් විසින්ද ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය දිසාපති තුමා විසින් පවරාගෙන ඇත.

ඒ. පී. ජී. ජයසේකර,
පොළොන්නරුව දිසාපති වෙනුවට.

1970 මැයි මස 7 දින,
පොළොන්නරුව දිසාපති කාර්යාලයේ දීය.

### උපලේඛනය

(1) නව නගරයේ පිහිටි අංක 5 බී 1 දරණ රජයේ නිවාසය අලුත්වැඩියා කිරීම.

5–303—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මධ්‍යම කොට්ඨාශය භාර නත්තරන්පොත කුණ්ඩසාලේ වාසී ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1970 ජූනි මස 10 වෙනි බුද දින පෙරවරු 10 දක්වා භාර ගනු ලැබෙ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ:—

| වැඩ විස්තර | ටෙන්ඩර් කරුගේ ලියාපදිංචි මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 1. වැවතැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම—වැ බැම්මෙ පස් වැඩ ... ... | 57,000 ... | 100 |
| 2. කුඩාගෝන වැව—ගංවතුර හානි අළුත්වැඩියා කිරීම ... ... | 37,000 ... | 50 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

1970 මැයි මස 22 දින සිට 1970 ජූනි මස 9 වෙනි දින දක්වා සාමාන්‍ය කායඝාලීය වේලාවන්හි දී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු කායඝාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැත්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩ යන්ත්‍රෝපකරණ මගින් කළ යුතුව ඇති බැවින් ටෙන්ඩර්කරුවන් ඔවුන් සතුව ඇති යන්ත්‍රෝපකරණවල ලැයිස්තුවක්ද ඉදිරිපත් කළ යුතුය. සුදුසු යන්ත්‍රෝපකරණ ඔවුන් සතුව ඇති බව ඒත්තු ගියහොත් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කිරීම ගැන සලකා බලනු ලැබෙ.

ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මෙම ටෙන්ඩරය ගැන සියලු විස්තර කායඝාලීය වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කායඝාලයේ දී ලබාගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොටස.

1970 අප්‍රේල් මස 29 වැනි දින,
මාතලේ වාරිමාර්ග කායඝාලයේ දී ය.

5–159—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩ විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් වියයුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජූනි මස 10 දින ප. ව. 3.00ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

එච්. ඇල්. පී. පෙරේරා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
අනුරාධපුර දිස්ත්‍රික්කය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1970 මැයි මස 6 දින,

5–305—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා**—වර්ෂ 1970 ජූනි 1 වනද සිට 1970 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට '' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය.. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1969/70 වර්ෂය සඳහා පුස්තකාල පොත් සැපයීම

පුස්තකාල පොත් සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1970 ජූනි මස 6 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර විවෘත කරන වේලාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1970 ජූනි මස 5 වැනි පස්වරු 4.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුනේ කෙළවරේ "1969/70 වර්ෂය සඳහා පුස්තකාල පොත් සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය" යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියා පදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමැති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන්වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයෙහි සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. ආදර්ශ පිටපත්, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම්.

1970 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

5-246—70.5. 15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

70.5.30 දින දවල් 12 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, වැතැම් වීදියේ, ද මැල් ගොඩනැගිල්ලේ, අංක 103 1/1 දරන ස්ථානයේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

| ස්ථානය | කළයුතු වැඩ |
|---|---|
| 1. අනුරාධපුරය ... | ළමා නිවාසයක් තැනීම |
| 2. අනුරාධපුරය ... | රිමාන්ඩ් නිවාසයක් තැනීම |
| 3. සහතික කළ බාලිකා පාසැල රම්මුතුගල, කඩවත ... | සාත්තු කාමරයක්, කෑම ගන්නා කාමරයක් සහ මුළුතැන්ගෙයක් තැනීම |
| 4. ළමා නිවාසය, පානදුරය ... | සාත්තු කාමරයක් තැනීම |
| 5. රිමාන්ඩ් නිවාසය, දෙහිවල... | සාත්තු කාමරයක් තැනීම |
| 6. ළමා නිවාසය, බණ්ඩාරවෙල | සාත්තු කාමරයක් තැනීම |

**කොන්ත්‍රාත් කරුවන් ලියා පදිංචි කිරීමේ සුදුසුකම් :—**

1. රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවල රු. 75,000 ට නො අඩුව වැඩ සඳහා.
2. රජයේ දෙපාර්තමේන්තු හා සස්ථාවල රු. 40,000 ට නො අඩුව වැඩ සඳහා.

3 සිට 6 දක්වා රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවල රු. 50,000 ට නො අඩුව වැඩ සඳහා.

(2) ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට ඒ ඒ වැඩ වෙනුවෙන් මෙම කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර 70.5.29 සවස 2 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මුදල් බැඳීමේ තුණ්ඩු නිකුත් කරන් බව සැලකිය යුතුය.

(3) අනුමත සාළු සමිති වලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක. ඔවුන්ගෙන් ටෙන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත. ඉහත සඳහන් මුදල් ප්‍රමාණය සඳහා කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බව ඔප්පු කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනවා ඇත.

(4) මෙම කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛන ගත තැපැලෙන් කොළඹ 1, වැතැම් වීදිය, ද මැල් ගොඩනැගිල්ල, අංක 103 1/1, දරණ ස්ථානයේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන වෙත එවිය යුතුය. එසේ නැත්නම් මෙම කාර්යාලයේදී බාර දිය යුතුය. ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම පැහැදිලිව ලියා තැබිය යුතුය.

(5) 70.6.1 දින පෙ. ව. 10 ට මෙම කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

(6) ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු මෙම කාර්යාලයේ වැඩ අංශයෙන් ලබාගත හැක.

ඇම්. වී. ඩී. චන්ද්‍රරත්න,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙනුවට.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
අංක 103 1/1, ද මැල් ගොඩනැගිල්ල,
වැතැම් වීදිය, කොළඹ 1.

5-202/2—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා පහත සඳහන් කාර්යාංශයන් සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි ඉදි කිරීමේ ද්‍රව්‍ය සැපයීමට 1969/70 මුදල් වර්ෂයේ අවසාන භාගය සඳහා මිළ ගණන් කැඳවීම.

කොළඹ, ගාල්ල, කළුතර බදුල්ල සහ යාපනය දිස්ත්‍රික්කයන් තුළ පිහිටි පහත සඳහන් කාර්යාංශවලට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 70.5.30 වැනි දින පෙ. ව. 12 දක්වා පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් මිළ ගණන් භාරගනු ලැබේ.

### කොළඹ දිස්ත්‍රික්කය

1. සහතික කළ බාලිකා පාසැල, රම්මුතුගල
2. වුඩ්පඩ් පිරිමි පාසැල, මාකොළ
3. ලේක් පාසැල, හික්කඩුව

### ගාල්ල දිස්ත්‍රික්කය

1. සහතික කළ පාසැල, කොග්ගල
2. ළමා නිවාසය, ගාල්ල
3. ලේක් පාසැල, හික්කඩුව

### කළුතර දිස්ත්‍රික්කය

1. ළමා නිවාසය, පානදුරය

### බදුල්ල දිස්ත්‍රික්කය

1. සහතික කළ පාසැල, කැප්පෙටිපොල
2. ළමා නිවාසය, බණ්ඩාරවෙල

### යාපනය දිස්ත්‍රික්කය

1. පර්න්හැම් පාසැල, අච්චුවේලි

### අවශ්‍ය ද්‍රව්‍ය

1. 6"×9" කළුගල් කියුබ් එකක්
2. 3/4" කැටගල් කියුබ් එකක්

3. ගං වැලි කියුබ් එකක්.

4. පිලිස්සූ ගඩොල් 1,000 ක් (පිළිගත් ප්‍රමාණය 8 3/4" × 4 1/2" × 2 3/4")

5. තම්බාපු හුණු බුසලක් (ශෝනියත් සමග රු. 85 කට නො අඩු විය යුතුය)

6. අළුහුණු බුසලක් (ශෝනියත් සමග රු. 42 කට අඩු නොවිය යුතුය)

7. උණ ගස් අඩි 25 ත් 30 ත් අතර.

ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා වෙන වෙනම රු. 50 බැගින් මෙම කාර්යාලයේ හෝ ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක අනුව ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. 70.5.29 වැනි දින දහවල් 10.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්ම වල ඉල්ලුම් කළ යුතු අතර, 70.5.30 වෙනි දින පෙරවරු 12 ට පෙර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපැලෙන් එවීම කළ හැක. ටෙන්ඩරය ලිපි කවරයක බහා සීල් තබා කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

70.6.1 දින ප. ව. 2.30 ට කොළඹ 1, චැතැම් වීදියේ, අංක 103 1/1 දරන ද මැල් ගොඩනැගිල්ලේ පිහිටි පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

සාර්ථක වූ ටෙන්ඩර් කරුවන්ට දන්වූ විට සතියක් ඇතුළත දී ඔවුන් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත කාල සීමාවක් තුළදී එම ගිවිසුමකට නො බැඳුනහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර ඔවුන්ගේ නම් කොන්දේසි කඩකල කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් වන්නේ ය.

ඇම්. වී. ඩී. චන්ද්‍රරත්න,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන වෙනුවට.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
103, 1/1, චැතැම් වීදිය,
කොළඹ 1.

5–202/2—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ලී/95.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මොනරාගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 ජූනි මස 5 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) තිස්ස-කතරගම ව්‍යාපාරයේ මුල්ගුරු නිවාසයක්, උපගුරු නිවාස දෙකක්, ජල මුද්‍රිත වැසිකිලි පහක්, ළිඳක් සහ කාර්යාල සහ ගබඩාකාමර සමග පංති කාමර පහක් තැනීම.

2. රුපියල් 100,000 හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට 1970 ජූනි මස 2 වෙනි දින දවල් 12 වන තෙක් මොණරාගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර්පත්‍ර අපේක්ෂකයා විසින් මොනරාගල කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ, මහා භාණ්ඩාගාරයේ. හෝ ඉහත සඳහන් වැඩය වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මොණරාගල දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද, ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී තිබෙන්නේ නම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිවේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස්ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක් ද සමග ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපැලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළයුතුය.

6. 1970 ජූනි මස 5 වෙනි දින පස්වරු 2.30 ට ඉහතකී අංක 357 දරන කාමරයේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තු යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතුය.

8. වැඩි විස්තර මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තැනගෙන් ලබාගත හැකිය.

පී. ජී. පුංචිහේවා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 මැයි මස 6 වන දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

5–274—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

කොළඹ 7, රොස්මීඩ් පෙදෙසේ අංක 55 දරණ ස්ථානයේ පිහිටි ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තැන විසින්, 1970 මැයි මස 24 වන දින පස්වරු 3 දක්වා පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

පහත දැක්වෙන ගෙවීම්, මුදලින් තැන්පත් කිරීමෙන් පසු, 1970 මැයි මස 23 වන දින දහවල් 12 දක්වා අදාළ ටෙන්ඩර් ලියකියවිලි පහත අත්සන් තබන අයගෙන් ලබාගත හැක :—

(1) දෙදියවල බෝල් ක්ලේ

නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදල ... රු 500

නැවත ලබාගත නොහැකි ටෙන්ඩර් ගාස්තුව ... රු. 10

(2) ඝනවර්ගයේ කැලෑ දර සැපයීම

නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදල ... රු. 100

නැවත ලබාගත නොහැකි ටෙන්ඩර් ගාස්තුව ... රු. 10

සැපයීම් කළමනාකරු.

සැපයීම් හා වාණිජ දෙපාර්තමේන්තුව,
ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
අංක 55, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.

5–260—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

අම්පාරයේ පරගහකැලේයෙහි තේක්ක බීජ ගබඩාවක් ඉදිකිරීම සඳහා 1970 මැයි මස 29 වැනි දින පස්වරු 12 වන තෙක් නැගෙනහිර දිසා වන නිලධාරි, මඩකලපුව විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන් රු. 25 ක මුදලක් තැන්පත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

3. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් හෝ අම්පාර කැලෑ කාර්යාලයෙන් හෝ ලබාගත හැක.

එස්. මුතයියා,
දිසා වන නිලධාරි, නැ. දි.

දිසා වන කාර්යාලයේදීය.
මඩකලපුව, 1970.4.27 දින.

5–299—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## වවුනියාව කච්චේරිය

වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා වෙන් වෙන්ව මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 ජූනි මස 2 වැනි අඟහරුවාදා දහවල් 12 දක්වා භාර ගනු ලැබේ:—

(1) මහකච්චකොඩිය හී පොදු ළිඳක් සෑදීම.

(2) පාලමෝඩ්ඩයි හී පොදු ළිඳක් සෑදීම.

(3) තන්නිමූරිප්පු හී පොදු ළිඳක් සෑදීම.

(4) මාන්කුලම් ජනපදයෙහි පොදු ළිඳක් සෑදීම.

(5) ආනන්දපුරම් හී පොදු ළිඳක් සෑදීම.

(6) වෙමාමඩුහී ජ.නි. ගේ නිවාසය වැඩි දියුණු කිරීම.

(7) පාවක්කුලම් හී III වන පියවරේ ජ.නි. ගේ නිවාසය වැඩි දියුණු කිරීම.

(8) පාවක්කුලම් හී I වන පියවරේ ජ. නි. ගේ නිවාසය වැඩි දියුණු කිරීම.

(9) පෙරියතම්බනෙහි හී ජ.නි. ගේ නිවාසයේ අතිරේක කටයුතු.

(10) පෙරියතම්බනෙහි හී ජ.නි. ගේ නිවාසයට ළිඳක් සෑදීම, දම්වැල් ගැසීම හා ගේට්ටු සවි කිරීම.

(11) තන්නිමූරිප්පු හී ජ.නි. ගේ නිවාසයට ළිඳක් සෑදීම, දම්වැල් ගැසීම හා ගේට්ටු සවි කිරීම.

(12) ඉඩම් ශාඛාවේ (අළුත් ගොඩනැගිල්ලේ) අතිරේක කටයුතු.

2. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒවා වවුනියාව කච්චේරියෙන් ලබා ගන්නා ලද නියමිත ෆෝර්මවල විය යුතුය. මේ සම්බන්ධව වෙනත් සියලු විස්තර වවුනියාව කච්චේරියෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් හා අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වේ. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නන්ට ටෙන්ඩර් ෆෝර්ම සහ අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසි න් ඒ ඒ එක් එක් වැඩය වෙනුවෙන් වවුනියාව කච්චේරියේ රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සි පතක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ග්‍රාම සංවර්ධන සමිති හා විවිධ සේවා සමූපකාර සමිති මෙම තැන්පත් මුදල් බැඳීම අවශ්‍ය නොවේ. 70.5.22 දින සිට 70.6.1 දින දක්වා මෙම දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

බී. සී. පෙරේරා,
දිසාපති, වවුනියාව දිස්ත්‍රික්කය.

1970.5.6 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේදීය.

5–285—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

දවුලගල ගම්බද උසාවියට එකතු කිරීම් හා අලුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970 ක්වූ ජූනි මස 7 වැනි දින පෙ. ව. 10.30 වනතෙක් භාරගනු ලැබේ.

මහනුවර/ගො/දෙ හි දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබා ගත් ආකෘති පත්‍රවල ටැන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිවන අතර, සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට හැකිය.

ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6,000 නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 මැයි මස 29 දා ප. ව. 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර් පත් ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10ක් බැගින් වූ ආපසු නොගෙවනු ලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරණ අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලුම විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරණ නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මංඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

සී. යෝගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගො).

1970 මැයි මස 6 වැනි දින,
මහනුවර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ,
අධිකාරි ඉංජිනේරු කාර්යාලයේදීය.

5–244—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීමේ දැන්වීම

අංක 14,903 හා 70. 4. 24 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී ඇති යාපනය ආණ්ඩුවේ මහාරෝගය ශාලාවේ දැනට ඇති ලේ ගබඩාව ශල්‍ය කර්මාගාරයට හැරවීම සඳහා වූ ටෙන්ඩර් කැඳවීම් දැන්වීම අවලංගු කරන ලදී.

වී. මානික්කම්,
අධිකාරි ඉංජිනේරු, උ. කො.,
(ගොඩනැගිලි).

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
යාපනය, 70. 5. 6.

5–279—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

කුරුණෑගල නගරයේ නො. 78 දරන බෞද්ධාලෝක පාරට යාව නවීන සියළුම පහසුකම් ඇති බංගලාවක් (වැඩි විස්තර උප ලේඛනය බලන්න.) මලියදේව බාලිකා විද්‍යාලයට, මලියදේව පිරිමි විද්‍යාලයට—ශාන්ත ආනා විද්‍යාලයට—මහ රෝහල—තැපැල් කන්තෝරුව—පොලීසිය—වෙළඳ පොළ—උසාවිය සහ සැම ආණ්ඩුවේ සහ පෞද්ගලික ආයතනවලට සැතපුම් $\frac{1}{4}$ සිට $\frac{3}{4}$ ක් දුර ප්‍රමාණය ඇත. විදුලි බළය, ජලනල පහසුව ළිං වතුර ඇති වටිනා ඉඩම සහ ගෙය ජයා පතිරණ මහතා ගේ නිවසට යාබදව මා 1970 ජූනි මස 11 වැනි දින පස්වරු 4 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මට ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් තුමා විසින් දී ඇති ආඥාව පිට (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වෙනි පරිච්ඡේදයේ) අංක 76 දරන වගන්තිය යටතේ, හා 1966 අංක 36 දරන (සංශෝධිත) පනත යටතේ, විකිණීම සඳහා බළය දී ඇත. 1969.8.10 දින තෙක් අයවිය යුතු රුපියල් හතලිස් තුන්දාස් එකසිය එකයි, ශත අනූ පහ (43,101.95.) 1969.5.28 වෙනි දිනට පසුව ගෙවන ලද රුපියල් එක්දාස් තුන් සියය (1,300) හැර ඩබ්ලිව්. ඩබ්ලිව්. ප්‍රේමරත්න මහතාගෙන් අය කර ගැනීම සඳහා එසේම 1969.8.10 වෙනි දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තව දුරටත් වූ රුපියල් දහතුන් දාස් හාරසිය හැත්තෑවයි ශත විසි නවය (13,470.29) ක මුදලක් සම්බන්ධයෙන් වන පොළී මුදල වර්ෂයකට සියයට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත

උකස්කරය ප්‍රකාර 69.8.10 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වෙන සියළුම දඩ මුදල් සමග අය කර ගැනීමත් එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත් මීට අමුණා ඇති ලේඛණයේ දක්වා ඇති ඉඩම සහ ඊට අදාළ සියළුම දේත්,

උප ලේඛණය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ තිරගත් දහයේ කෝරළේ කුරුණෑගල නාගරික සීමාව තුළ බටහිර රවුම් පාරේ වරි පනම් අංක 78 දරන බටහිර වටරවුම් පාරේ පිහිටි ජී. ඒ. ද සිල්වා බලය ලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 5241 හා 1950.11.28 දින දරන සැලැස්මේ සඳහන් පර්චස් දහනවයක (අ. 0, රූ. 0, ප. 19) ප්‍රමාණයෙන් යුත් ඊසානින් :—අදොන්චිහාමිගේ සහ මුදියන්සේ ආරච්චි ගේ දේපොළින් ද, ගිණිකොණින් :—පෙර කී සැලැස්මේ "බී" දරන කැබැල්ලෙන් සහ නිරිතෙන් :—බටහිර රවුම් පාරෙන් ද මායිම් වූ අංක ඒ. 586/215 'යටතේ ලියා පදිංචි "ඒ" අක්ෂරය දරන ත්‍රිකෝණාකාර ඉඩම් කැබැල්ල, එහි තනා ඇති නිවාසය, වැවිල්ල සහ සියළු දේ.

ඉහත කී අංක 5241 දරන සඳහන් මෙම ත්‍රිකෝණාකාර කොටස පහත නම් සඳහන් යාව පිහිටි කොටස් වලින් බෙදා වෙන් කරන ලද කොටසකි.

(අ) හිටින වත්ත නැමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අඩ කොටස ගම්බිරිගහ වත්ත නැමැති ඉඩම, කිලින්ගහමුල වත්ත නැමැති ඉඩමේ බෙදූ අඩ කොටස, මී ගහ මුළ වත්ත නැමැති ඉඩම සහ පතිණිහාමි හිටිය වත්ත නැමැති ඉඩමේ බෙදූ තුනෙන් දෙපංගුව, සහ ඊට යා බද පිටිය මේවා එක කොටසක් ලෙස සෑදී ඇත.

(ආ) හිටින වත්තේ නැගෙනහිර කොටස (ඇ) මූන් වත්ත නොහොත් මීගහමුල වත්ත නැමැති වත්ත,

(ඇ) අඹගහ කුඹුර (ඉ) හිටින ගෙදර වත්ත නොහොත් කොස්රුප්පවත්ත (ඊ) දිවුල්ගහමුළ වත්ත සහ,

(උ) ගන්සූරියගහමුල වත්ත නොහොත් සූරියගහමුළවත්ත එක් ඉඩමක් සේ සෑදී ඇති මෙම කොටස් අංක ඒ. 582/21? යටතේ ලියා පදිංචි වී ඇත.

වැඩි විස්තර සඳහා ජාතික නිවාස කොමසාරිස් ගෙන් විමසන්න.

එෆ්. වැන්ඩර්පූටන්.

නො. 8, පැරකුම්බා වීදිය,
කුරුණෑගල.

5–341—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| අප්‍රේල් | 70. 4. 3 සිකුරාද | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.